www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු ස්ටැලින්වාදියෝ කොංග්‍රසයේ නායකත්වයෙන් යුත් නව-ලිබරල් පිලිවෙත්වලට කැප වූ තන්ත්‍රයට සිය සහයෝගය යලි තහවුරු කරති

## Indian Stalinists reaffirm support for Congress-led regime committed to neo-liberal policies

**කීත් ජෝන්ස් විසිනි**
**2005 අප්‍රේල් 7**

බදාදා පැවති ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාක්ස්වාදී) -- සීපීඑම් -- 18 වන ජාතික සම්මේලනයේ ආරම්භක සැසියේ දී, සීපීඑම්හි ජ්‍යෙෂ්ඨම නායකයන් දෙදෙනා ඉදිරිපත් කලේ, 11 මස් වියැති එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) ආන්ඩුවට සිය පක්ෂය දෙන අඛන්ඩ සහයෝගය ආරක්ෂා කිරීමේ හා යුක්තියුක්ත කිරීමේ එල්ලයෙන් යුත් දේශන ය.

එහෙත්, සම්මේලනයේ ප්‍රධාන යෝජනාවේ වචන යොදා ගත හොත්, යූපීඒ සිය පූර්වගාමියා ගෙන ගිය "එම ලිබරලීකරන හා පුද්ගලීකරන පිලිවෙත් ම අනුගමනය කරන" බව සීපීඑම් නායකත්වය පිලිගනී. යෝජනාව තව දුරටත් සඳහන් කරන පරිදි, "ආන්ඩුව සිය ගමන් මාවත වෙනස් කිරීමට අකැමති" අතර "සාරාර්ථයෙන් ගත් කල," හින්දු අධිපතිවාදී භාරතීය ජනතා පක්ෂයේ නායකත්වයෙන් යුත් (බීජේපී) ජාතික ප්‍රජාතන්ත්‍ර සන්ධානයේ ආන්ඩුව ගෙන ගිය "පිලිවෙත් ම අනුගමනය කරයි".

ඉන්දියානු ධනේශ්වරයේ සම්ප්‍රදායික පාලක පක්ෂය ද යූපීඒ තුල ආධිපත්‍යය දරන හවුල්කරු ද වන කොංග්‍රසය "අන්තරවලෝකනයක යෙදිය යුතු" යයි සීපීඑම් දේශපාලන මන්ඩලය සාමාජික සහ බටහිර බෙංගාලයේ හිටපු මහ ඇමති ජෝති බාසු පැවසී ය. "එම අවිචාරවත් ලිබරලීකරන හා පුද්ගලීකරන ආර්ථික පිලිවෙත් ම අඛන්ඩව ඉදිරියට ගෙන යාම එයට කල හැකි ද? එහි පිලිවෙත් හා බීජේපීයේ පිලිවෙත් අතර කිසිදු වෙනසක් නොපවතිනු ඇති ද?"

සත්‍යය කාරනාව නම්, 1991 සිට 1996 දක්වා බලයේ සිටිය දී, ඉන්දියානු ධනේශ්වරයේ මූලෝපාය ජාතික ආර්ථික සංවර්ධනයේ සිට විදේශ ආයෝජන ආකර්ෂනය කර ගැනීම හා නිර්යාතවලින් මෙහෙයවෙන වර්ධනය මත යොමු වූ සංවර්ධනයක් බවට මාරු කිරීමට මූලිකත්වය ගත්තේ, කොංග්‍රසය බව යි. එතැන් පටන්, සීපීඑම් නායකත්වයෙන් යුත් බටහිර බෙංගාලයේ ප්‍රාන්ත ආන්ඩුව ඇතුලු, මධ්‍යම හා ප්‍රාන්ත මට්ටමේ ඉන්දියාවේ සියලු ආන්ඩු, ජාතිකව-නියාමනය කෙරුනු ආර්ථිකය බිඳවිසිරවීම හා ඒ සමග බැඳී රාජ්‍ය අංශයේ ඒකක විකුනා දැමීම, පොදු සේවාවන් හා මිල සහනාධාර කප්පාදු කිරීම සහ කලමනාකරනයේ ඉල්ලීම්වලට කම්කරුවන් වඩා යටත්පහත් බවට පත් කිරීම යන පිලිවෙත් ක්‍රියාවට දැමීමෙහි ලා සහභාගි වී තිබේ.

ඔහුගේ අයහපත් සෞඛ්‍ය තත්වය හේතු කොටගෙන, සීපීඑම් ප්‍රධාන ලේකම් හර්කිෂන් සිං සුර්ජිට්ගේ කතාව වෙනත් පක්ෂ නායකයකු ලවා කියැවීමට සිදු වූ අතර එහි දී සුර්ජිට් පැවසූ පරිදි, සීපීඑම් යූපීඒ ආන්ඩුවට සහයෝගය දෙන්නේ "වත්මන් තත්වයේ හදිසි අවශ්‍යතා සපුරාලීම" පිනිස ය. අවසානයේ කොංග්‍රසයට හා බීජේපීයට "තෙවන විකල්පයක් ගොඩනැගීමට සීපීඑම් වඩා කැමති බවත් සීපීඑම් "අපගේ මූලික න්‍යාය පත්‍රය අතහැර නොදමන" බවත් ඔහු පැවසී ය.

වෙනත් වචනවලින් කිය තොත්, සීපීඑම් කොංග්‍රසයේ නායකත්වයෙන් යුත් යූපීඒ බලයේ තබා ගැනීමට දිගට ම ක්‍රියා කරනු ඇත.

සීපීඑම් පිහිටුවන ලද්දේ සෝවියට් ස්ටැලින්වාදී නිලධරයේ විදේශ පිලිවෙත් අවශ්‍යතාවන්ට අනුකූලව කොංග්‍රස් පක්ෂයේ වහලකු ලෙස සිටි ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයෙන් (සීපීඅයි) භේද වීමෙන් පසුව 1964 දී ය.

තමන් කාල් මාක්ස්ගේ හා වී.අයි. ලෙනින්ගේ විප්ලවවාදී ජාත්‍යන්තර සමාජවාදී සම්ප්‍රදායේ උරුමක්කාරයන් බව සීපීඑම් කියාපායි. මෙම කියාපෑම කොතෙක් දුරට අසත්‍යය ද යන වග පිලිබඳ එක් නිදසුනක් නම්, සෝවියට් කම්කරු පන්තිය අතින් බලය උදුරා ගත් වරප්‍රසාදිත නිලධරයේ දේශපාලන ප්‍රකාශකයා ලෙස සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය තුල සමාජවාදීන්ට එරෙහිව සැබැවින් ම ජන ඝාතනයක් ගෙන ගිය ජෝශප් ස්ටැලින්ට වන්දනාමාන කිරීමෙහි සීපීඑම් දිගට ම යෙදීගැනීම යි.

තවත් කාරනාවක් නම්, වැඩෙමින් පවතින චීන කම්කරු පන්තිය මත පෙර පැවති වික්ටෝරියානු යුගයේ සූරාකෑමේ කොන්දේසි පැටවීමෙහි ලා ජාත්‍යන්තර ප්‍රාග්ධනය සමග අතිශය සමීපව වැඩ කරන චීන කොමියුනිස්ට් පක්ෂයට සීපීඑම් ආවැඩීමයි. "චීනයේ ශීඝ්‍ර ආර්ථික වර්ධනය සහ සර්ව-පාර්ශ්ව ප්‍රගතිය ජාත්‍යන්තර කරලියේ ප්‍රධාන බලයක් ලෙස එරට මතුවීමට තුඩු දී ඇතැ"යි සීපීඑම් 18 වන සම්මේලන යෝජනාව ප්‍රකාශ කරයි. "චීන ආන්ඩුව සහ කොමියුනිස්ට් පක්ෂය, චීනයේ ශීඝ්‍ර වර්ධනයේ හා ගෝලීය ධනවාදී ක්‍රමය සමග එයට පවත්නා සම්බන්ධතාවයේ ප්‍රතිඵල වන විරැකියාව, ප්‍රාදේශීය අසමානතා සහ දූෂනයේ නැගීම යන ගැටලු සමග පොර බැදීමෙහි යෙදී සිටී."

වඩා අඩු වැදගත්කමකින් යුතු නමුත් කෙසේ වෙතත් එලිදරව්කාරක තෙවන කාරනාවක් නම්, සහෝදර නියෝජිතයන් ලෙස සිය සම්මේලනයට සහභාගි වන ලෙස ශ්‍රී ලංකාවේ ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නායකයන්ට ආරාධනා කිරීමට සීපීඑම් ගත් තීන්දුවයි. ශ්‍රී ලංකාවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආන්ඩුවේ කොටස්කරුවකු වන ජවිපෙ, ජනතාවාදී වාග් පාඨ වමාරමින් මාඕට සහ කැස්ත්‍රෝට ප්‍රශස්ති ගයන නමුත් එය ආන්තික දෙමල විරෝධී ස්වෝත්තමවාදී පක්ෂයකි.

**පවත්නා සමාජ පර්යායේ මුක්කුවක්**

ස්වයං-ප්‍රකාශිත දේශහිතෛෂී පක්ෂයක් වන සීපීඑම් වනාහි ඉන්දියාවේ ධනේශ්වර පර්යායේ වාමාංශයයි.

ඉන්දියාව ලෝක ධනවාදය සඳහා අඩු-වැටුපට භාන්ඩ නිෂ්පාදනයේ, කාර්යාල ක්‍රියාදාමයන්හි සහ පර්යේෂන කටයුතුවල යෙදෙන නිෂ්පාදකයකු බවට පරිවර්තනය කිරීමට ඉන්දියානු ධනේශ්වරය දරන ප්‍රයත්නයන් මගින් නිර්මිත සමාජ අර්බුදය හේතු කොට ගෙන සීපීඑම් සංවිධානයට දේශපාලන බල සංස්ථාපිතය තුල පෙර නොවූ විරූ ආනුභාවයක් ලැබී ඇත.

පසුගිය මැයි මස බලයට පත් වූ යූපීඒ ආන්ඩුව බලයේ රැඳී සිටින්නේ, සීපීඅයි හා තවත් පක්ෂ ඇතුලත් නමුත් සීපීඑම් විසින් ආධිපත්‍යය දරනු ලබන, බහු-පක්ෂ සභාගයක් වන වාම පෙරමුන පුදන පාර්ලිමේන්තු මුක්කු බලයට පින් සිදු වන්ට ය.

යූපීඒ ආන්ඩුව තැනෙන අවස්ථාවේ, කොංග්‍රසය කැබිනට් තනතුරු භාර ගන්නා ලෙස වාම පෙරමුනෙන් ඉල්ලා සිටියේ ය. එහෙත් සීපීඑම් කල අවධාරනයන් හමුවේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට වාම පෙරමුන තීන්දු කලේ ය. එසේ කිරීම සඳහා එය සඳහන් කල ප්‍රධාන හේතුවලින් එකක් වූයේ, යූපීඒ ආන්ඩුවට එරෙහි විරුද්ධත්වය මත ඒකාධිකාරයක් දැරීමට බීජේපීය සමත් වනු ඇතැයි යන්න ගැන තමන්ට පවත්නා භීතියයි. මෙම ප්‍රකාශය මගින් අවධාරනය කෙරෙන්නේ, තමන් නව ආන්ඩුවකට උපත ලබා දීමට සහාය දෙන නමුත් එය මහජන විරෝධයට ලක් වන පිලිවෙත් ගෙන යනු ඇති බව සීපීඑම් නායකත්වය හොඳින් අවබෝධ කරගෙන සිටි බවයි.

ඉන් අනතුරුව, පූර්න පස් අවුරුදු කාල සීමාව ම යූපීඒ ආන්ඩුව බලයේ තබා ගැනීමට තමන් කැප වන බව ප්‍රසිද්ධියේ පෙන්නුම් කරන ලෙස කොංග්‍රස් නායකත්වය කල ආයාචනයන්ට හිස නැමූ සීපීඑම්, ඉන්දියානු පාර්ලිමේන්තුවේ පහල මන්ත්‍රී මන්ඩලය වන ලෝක් සභාවේ කතානායක තනතුරට තම පක්ෂයේ නායකයකු පත් කිරීම ද පිලිගත්තේ ය.

යූපීඒ සභාගයේ කොටස්කරුවන් අතර පවත්නා ගිවිසුමක් වුවත් සීපීඑම් සංවිධානයේ හා වාම පෙරමුනේ සහායෙන් කෙටුම්පත් කෙරුනු ලියවිල්ලක් වන, "පොදු අවම වැඩපිලිවෙල" ක්‍රියාවට දැමීම නිරීක්ෂනය කරනු පිනිස පිහිටුවන ලද කමිටුවක් හරහා සීපීඑම් හා වාම පෙරමුන ආන්ඩුවට ආකාරගත ආකාරයෙන් ද බැඳී ඇත.

වාම පෙරමුන ආන්ඩුවට සම්බන්ධ කර ගැනීමෙහි ලා කොංග්‍රසය එතරම් ම උනන්දු වූයේ හුදු පාර්ලිමේන්තු ගනන් හිලව් පිලිබඳ කාරනාවක් හේතු කොට ගෙන නො වේ. එම පක්ෂය ම මහත් විශ්මයකට පත් කරවමින්, බීජේපීයේ නව-ලිබරල් පිලිවෙත්වලට එරෙහි මහජන විරුද්ධත්වයක රැල්ලක් මත කොංග්‍රසය යලි බලයට පත් විය. කම්කරුවන් දොට්ට දැමීමට හා වැඩ පොලවල් වසා දැමීමට පවත්නා සීමාවන් අහෝසි කිරීම ඇතුලු නව-ලිබරල් ප්‍රතිසංස්කරනවල නව රැල්ලකට එරෙහිව මතු වන මහජන විරුද්ධත්වය ජයගැනීමට පවත්නා හොඳම ක්‍රමය නම් සීපීඑම් නායකත්වයෙන් යුත් වාම පෙරමුන ආන්ඩුවට එක්කර ගැනීම බවට කොංග්‍රසය වහාම නිගමනය කලේ ය.

මෙම තක්සේරුව සමග මහ ව්‍යාපාරිකයන් එකඟ වේ යන කරුන පෙන්නුම් කෙරෙන එක් සාධකයක් නම්, නව ආන්ඩුව කඩාකප්පල් කිරීමට හා අස්ථාවර කිරීමට බීජේපීය දරන ප්‍රයත්නයන්ට සංගත මාධ්‍ය වෙතින් කිසිදු සැලකිය යුතු සහයෝගයක් නො ලැබීම යි.

එහෙත් මිලිටරි වියදම් සියයට 25කින් ඉහල දැමීම, ආර්ථිකයේ නව අංශ විදේශ ආයෝජනවලට විවෘත කිරීම සහ සෑම දුප්පත් හා අඩු ආදායම් ලබන පවුලක ම අඩු ගනනේ එක් සාමාජිකයකුට හෝ වසරකට වැඩ දින 100ක් සහිත රැකියා සැපයීමට දුන් පොරොන්දුව කප්පාදු කිරීම ඇතුලු යූපීඒ ආන්ඩුවේ ක්‍රියා හේතු කොටගෙන සීපීඑම් නායකයන් භීතියට පත්ව ඇත්තේ ආන්ඩුවට එරෙහිව එලඹෙන මහජන ප්‍රතික්‍රියාව තමන්ට විරුද්ධව හැරෙනු ඇත යන්න ගැන ය.

වාම පෙරමුනේ පීඩනයට ප්‍රතිචාර වසයෙන්, යූපීඒ සිය පෙබරවාරි අයවැයෙන් සමාජ වියදම්වල සුලු වැඩිවීමක් නිවේදනය කල නමුත් ඒ සමග ම මුදල් ඇමති පැවසුවේ මූල්‍ය අර්බුදයක් පිලිබඳ අවදානමෙන්

තොරව ආන්ඩුවට දැරිය හැකි සීමාව කරා තමන් ලඟා වී ඇති බවයි.

යථාර්ථය නම් ඉන්දියාව දූවැන්ත සමාජ කලබැගෑනියක ඉස්මත්තෙහි සිටින බවයි. වසර 14ක නව-ලිබරල් ප්‍රතිසංස්කරන මගින් නිරතුරුව වැඩෙන ආර්ථික අනාරක්ෂක භාවය, ගැඹුරු වන දරිද්‍රතාව සහ වැඩෙන සමාජ අසමානතාවක් නිර්මානය කෙරී ඇත. ඉන්දියාවේ ග්‍රාමීය ප්‍රදේශ අද අත්දකින්නේ දශක ගනනාවක් තුල පැවති දරුනු ම කෘෂිකාර්මික ආපදාව ලෙස විස්තර කල හැකි තත්වයකි. ගම්බද හා ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන යන දෙතැන්හි ම විරැකියා තර්ජනය වැඩෙමින් පවතී.

අනෙක් අතට, අසාර්ථක වූ බීජේපී මැතිවරන ව්‍යාපාරයේ සටන් පාඨය යොදා ගත හොත්, ධනේශ්වරය විශ්වාස කරන්නේ "ඉන්දියාව දිදුලන" බවයි. ඔවුන් විශ්වාස කරන්නේ නැත හොත් විශ්වාස කිරීමට කැමති වන්නේ, විදේශ ප්‍රාග්ධනය ගලාඒමට හා ඉන්දියාවේ මිලිටරි බල පරාක්‍රමයට ස්තුති වන්ට තමන් ලෝක කරලියේ ප්‍රධාන බලයක් බවට පත්වීමේ අද්දර සිටින බවයි.

එහෙත් ධනේශ්වරය සිය අධිෂ්ඨානයන් හා අභිලාෂයන් පදනම් කරන්නේ පුපුරන සුලු අසමතුලිතතා හා ප්‍රතිවිරෝධතාවලින් -- වර්තන ගිනුමේ අති දූවැන්ත හිඟයක්, අති දූවැන්ත වෙලඳ හා අයවැය හිඟයන් සහිතව එක්සත් ජනපදය තුල සිය තියුනුම ප්‍රකාශනය අත්පත් කර ගන්නා ප්‍රතිවිරෝධතාවලින් -- ගහන ලෝක ධනේශ්වර ආර්ථිකයක් මත ය. එමෙන් ම එය ලෝක කරලියට ඇතුලු වෙමින් සිටින්නේ නිරතුරුව ම උත්සන්න වන මහ බලවතුන්ගේ භූ-දේශපාලනික ප්‍රතිවාදිත්වයේ යුගයක ය. ලෝක ආර්ථිකයේ යම් කඩා වැටීමක් හෝ විදේශ ආයෝජනවල යම් පහල වැටීමක්, 1997 අග්නිදිග ආසියානු මාදිලියේ කඩාවැටීමකට තුඩු දීමේ අවදානම මතු කරයි.

කම්කරු පන්තිය සහ පීඩිත ජනතාව කොංග්‍රසයේ නායකත්වයෙන් යුත් යූපීඒ ආන්ඩුවට ගැට ගැසීමට සීපීඑම් සහ වාම පෙරමුන තැත් කරන්නේ මෙවන් කොන්දේසි යටතේ ය.

එසේ කිරීමේ දී ඔවුහු තර්ක දෙකක් ඉදිරිපත් කරති. පලමුවැන්න නම්, පොදු අවම වැඩපිලිවෙල මගින් නව-ලිබරල් පිලිවෙත් ක්‍රියාවට දැමීම මන්දගාමී කල හැකි ය නැත හොත් ඒවායේ සැර බාල කල හැකිය යන්න ය. මෙය වනාහි ආරක්ෂා කිරීමට වඩවඩා අසීරු තර්කයකි. දෙවැන්න නම්, යූපීඒ සභාගයට සහයෝගය දීම හින්දු අධිපතිවාදී බීජේපීය බලයට ඒම වැලැක්වීමේ එක ම ක්‍රමය බවයි.

බීජේපීය නිසැකව ම දුෂ්ඨ ප්‍රතිගාමී බලවේගයකි. එහෙත් කම්කරු පන්තිය එයට එරෙහිව සටන් කොට එය පරාජය කිරීමට සමත් වන්නේ, ප්‍රතිගාමීත්වය ගසාකා ඇති සමාජ අර්බුදයට තමන්ගේ ම විසඳුම ඉදිරිපත් කරමින් පීඩිත මහජනතාව තමන් පිටුපසින් රැලි කර ගැනීම මගින් ම පමනි.

දශක ගනනාවක් තිස්සේ හින්දු ජාතිකවාදී දක්ෂිනාංශය ඉන්දියානු දේශපාලනය තුල නො තැකිය හැකි බලයක් ලෙස පැවතුනි. එය බලයට තරග කරන ව්‍යාපාරයක් බවට පත්ව ඇත්නම්, ඉන්දියානු ධනේශ්වරය සිය පශ්චාත්-ස්වාධීන ජාතික ව්‍යාපෘතිය කඩාවැටීම කම්කරු පන්තියට හා පීඩිත මහජනතාවට එරෙහි නව ප්‍රහාරයක් බවට පරිවර්තනය කිරීමට සමත් වූයේ නම්, ඒ ඉන්දියානු ස්ටැලින්වාදී පක්ෂ විසින් අනුයන ලද පන්ති සහයෝගිතාවාදී හා ජාතිකවාදී පිලිවෙත් හේතු කොට ගෙන ය. දශක ගනනාවක් තිස්සේ, සීපීඑම් සහ එහි සහෝදර ස්ටැලින්වාදී පක්ෂය වන සීපීඅයි, අධිරාජ්‍යවාදයට හා වැඩවසම් ප්‍රතිගාමීත්වයට එරෙහිව සටන් කිරීමේ නාමයෙන්. කම්කරු පන්තිය ඒ හෝ මේ ධනේශ්වර පක්ෂයට යටත් කොට, ඔවුන් සටන්කාමී වෘත්තීය සමිති අරගලයන්ට සීමා කලහ.

ඉන්දියාවේ කම්කරුවන් සහ සමාජවාදී-හිතැති පීඩිතයන් හා බුද්ධිමතුන් මුහුන දෙන කල්දැමිය නොහැකි කර්තව්‍යය නම්, ජාත්‍යන්තර කම්කරු පන්තිය සමග ඒකාබද්ධව අධිරාජ්‍යවාදයට හා ජාතික ධනේශ්වරයට එරෙහිව සටන් වැදීමට කැප වූ කම්කරු පන්තියේ නව මහජන සමාජවාදී පක්ෂයක් ගොඩනැගීමයි.

© www.wsws.org